
**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

**ර/නිවිතිගල අධ්‍යාපන කලාපය**

**සැකසුම : බී. ඩී. දසුන් රාජිත දන්වත්ත - ර/කලවාන ගාමිණි ම. ම. විද්‍යාලය**

# ***ජනමාධ්‍ය වර්ගීකරණය***




ජනමාධ්‍ය වර්ගිකරණය විවිධාකර ලෙස දැකගත හැකිය. ඉහත වර්ගවීම ප්‍රධාන ලෙසට දැකගත හැකිය.

තාක්ෂණයේ වර්ධනය සමග ඩිජිටල් මාධ්‍යයේ ආගමනයෙන් ජනමාධ්‍ය තවත් ආකාරයකට වර්ග කෙරේ.

කෙසේ වෙතත් ඉහත බෙදිම මත ඒ ඒ ජනමාධ්‍ය වර්ග පිළිබඳ විමසා බැලිම හරහා සරලව වටහා ගත හැක.

## **මුද්‍රිත මාධ්‍ය**

❖ පුවත්පත
- මුල්ම සංවිධාන ජන මාධ්‍ය ලෙස පුවත්පත හුඳුනාගත හැක.
- ලෝකය පුරා රටවල් විවිධ පුවත්පත් මුද්‍රණය කර ජනතා පරිශීලනය උදෙසා වෙළඳපලට යොමු කරයි.




- පුවත්පතෙහි මුලික ලක්ෂණ
  - ☛ මුද්‍රිත මාධ්‍යයකි
  - ☛ භාෂා සාක්ෂරතාව අවශ්‍යවේ.
  - ☛ සාපේක්ෂව උදාසීන මාධ්‍යයකි.

- තොරතුරු විස්තරාත්මකව ඉදිරිපත් කළ හැක.
- ග්‍රාහක අභිමතය පරිසදි පරිහරණය කළ හැකිය.
- අවම වශයෙන් සතියකට වරක්වත් පලවිය යුතුය.
- එය යාන්ත්‍රික මුද්‍රණ ක්‍රමයකින් නිෂ්පාදනය විය යුතුය.
- සියලු ක්ෂේත්‍රයන්හි ජනතාවට පරිශීලනය කල හැකි විය යුතුය.

මෙහි ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කරන විට පුවත්පත ජනමාධ්‍යයේ සුවිශේෂී ස්ථානයක ඇති බව පෙනි යයි. එහෙත් ඒ පිළිබඳ ඇති නිර්වචන කිහිපයක් හරහා මෙය තවදුරටත් විග්‍රහ කරගත හැකිය.

- සුමංගල ශබ්දකෝෂයට අනුව "පුවත්පත යනු ප්‍රවෘත්ති ප්‍රසිද්ධ කරන පත්‍රය" යන්නයි.
- යුනෙස්කෝ

යුනෙස්කෝ සංවිධානය පුවත්පත යන්න මෙසේ හඳුන්වා දී ඇත.

"එදිනෙදා ජිවිතයට අවශ්‍ය තොරතුරු යම් නිශ්චිත කාලවකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන , එකට නොබඳින ලද ප්‍රකාශයකි. "

- ඔක්ස්ෆරඩ් ශබ්ද කෝෂය

ඉංග්‍රිසි භාෂාවේ පුවත්පත හැඳින්වෙන්නේ "Newspaper " ලෙසයි. ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය පුවත්පත නිර්වචනය කරන්නේ මෙසේය.

මහජනයා උනන්දුව දක්වන ප්‍රවෘත්ති, වෙළඳ දැන්වීම්, සාහිත්‍ය හා සම්බන්ධ කරුණු හා අනෙකුත් අංශ ඇතුළත් ව දිනපතා හෝ සතිපතා පළ කරන මුද්‍රිත ප්‍රකාශනය පුවත්පතයි.

"පුවත්පත මුද්‍රිත ප්‍රකාශනයකි. එය එකට ගොනු වු කටු ගසා අමුණා නැති කඩදාසි ගොනුවකි. එය දිනපතා සතිපතා වශයෙන් පළ විය හැකිය. ඊට ප්‍රවෘත්ති, ඡායාරූප , විශේෂාංග හා වෙළඳ දැන්වීම් ඇතළත් වේ. විශේෂ නමක් ද එයට යොදා ඇත. "

- මෙම සරල විග්‍රහය වඩාත් සවිස්තරාත්මක ව **මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන්** විසින් සන්නිවේදනය ශබ්දාකරයේ මේ ආකාරයෙන් විග්‍රහ කර ඇත.





**News Paper** -දිනපතා සතිපතා හෝ වරානුකූල ව පුවත් සැපයීම සඳහා සැපයීමේ අරමුණින් පළමුවෙන් පටන් ගත් පත්‍රිකා විශේෂයකි. එහෙත් කාලානුරූප ව පුවත්පත යනු හුදු පුවත් සැපයීම සඳහා ම වෙන් වූ මාධ්‍යයක් වෙනුවට ඊට වඩා විවිධ අංගෝපාංග යන් ඇතුළත් වූ ප්‍රකාශන විශේෂයක් ලෙස හැඳින්විණි. පුවත්පත සඳහා ආරම්භයේ දී දෙනු ලැබූ නිර්වචනය වෙනස් වී ඇත්තේ තාක්ෂණය හේතු කොට ගෙන යි. නවීන දිනපතා පුවත්පතක් හෝ සතිපතා පුවත්පතක් විශේෂාංග රැසකින් සමන්විතය. දේශීය හා විදේශීය පුවත් සම්පාදනය හැරුණු කොට ඡායාරූප , කාටූන් , චිත්‍ර, තිරු, රචනා, වෙළෙඳ දැන්වීම් , කතු වැකි , නිර්මාණාංග වැනි අංග ඇතුළත් වේ. පුවත්පත් වර්ග ද කිහිපයක් ඇත. සාමාන්‍ය තොරතුරු සම්පාදනය හා විශේෂාංග ඇතුළත් පුවත්පත් හැරුණු විට විවිධ විෂයන්ට යොමු වුණු විශේෂ වර්ගයේ පුවත්පත් බිහි වී .තිබේ. ළමා, කාන්තා.ත ක්‍රීඩා, විද්‍යා , සිනමා ඉන් කිහිපයකි.

- ලංකාවේ පළමු පුවත්පත - ද කොලොම්බො ජර්නල් - 1832
- ලංකාවේ පළමු සිංහල පුවත්පත - ලංකාලෝකය -1860
- ලංකාවේ ලියාපදිංචි පළමු පවත්පත - ලක්මිණි පහන -1982 සැප්තැම්බර්

❖ <u>පොත්</u>

- නූතන ජනමාධ්‍යයේ ඉතිහාසය ආරම්භ වන්නේ පොත් මගිනි. එමඟින් සමාජයේ වෙනසක් ඇතිකිරීමට හැකියාව ලැබේ.
- මුල් කාලීනව දේශපාලන හා ආගමික මතයන් පොත් හරහා සමාජගත විය.
- චීනයේ දි ක්‍රි. ව. 868 **වජ්‍ර සූත්‍රය"** මුද්‍රණය මෙයට කදිම උදාහරණයකි. ඒ ලී බ්ලොක් ක්‍රමයෙන් මුද්‍රණය වූ යුගයේදීය.
- "පොත" යනු කුමක්දැයි වටහා ගැනීම උදෙසා එයට අදාළ නිර්වචන පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා අගනේය.




- සුමංගල ශබ්ද කෝෂය

"පොත් යනු ලියු හෝ මුද්‍රිත ග්‍රන්ථයකි. "

**"හරිශ්චන්ද්‍ර විජේතුංග "** මහතාගේ මහා සිංහල ශබ්ද කෝෂයට අනුව පිටු අංක 1163 .

ලියු හෝ මුද්‍රිත හෝ අමුද්‍රිත හෝ කොළ එකට එකිනෙකට නොගත් ලේඛණ මිටිය රොන් ලෙස හඳුන්වයි.



- යුනෙස්කෝව

පොතක් යනු පිට කවර දෙක හැර ඇතුළත පිටු 50 කට නොඅඩුවවන පරිදි තනි වෙළුමකින් යුතුව මුද්‍රණය කරන ලද කෘතියකි.

ඉහත නිර්වචන හරහා පොත පිළිබඳ යම් දළ අදහසක් ගොඩනගා ගත හැක.

පොතක ස්වරූපය හා එහි විෂය ක්ෂේත්‍රය වසර 500 ක සිට ක්‍රම ක්‍රමයෙන් විකාශය වෙමින් වෙනසකට ලක්වෙමින් පවතී. එහි එහි අද ප්‍රතිඵලයන් අන්තර්ජාල පොත් **"E Book "** සංකල්පයයි. ජංගම දුරකතනය හරහා අන්තර්ජාලය ඔස්සේ පොතක් කියවීමට පවා තාක්ෂණයේ පරිණාමනය සිදුව ඇත.

- <u>සඟරා</u>

මුද්‍රිත මාධ්‍ය තුළ පුවත්පතකට පොතක් වෙනස්වන ලක්ෂණ සහිතව රහිතවත් අඩුවැඩි වශයෙනුත් සඟරාව දැකගත හැකිය.




- කලාව
- ආගම
- ක්‍රීඩා
- විසා
- වාණිජ
- දේශපාලන
- ගෘහ විද්‍යාව
- සංස්කෘතිය
- අධ්‍යාපනය
- ක්‍රීඩා  මේ ආදී නොයෙක් ක්ෂේත්‍රයන් ආවරණ වන පරිදි සඟරා පළකෙරේ.

උදා:
- ◆ මුතුහර / මනහර
- ◆ ක්‍රීඩා
- ◆ දෙසතිය
- ◆ කැදැල්ල වැනි සඟරා අප රට තුළ වඩාත් ප්‍රචලිතව දැකගත හැකිය.

මෙලෙස දැකගත හැකි සඟරාවලද නිර්වචන කිහිපයක් හරහා ඒ පිළිබඳ වඩාත් ප්‍රබල අවබෝධයක් ලබාගත හැකිය.

- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය

ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය දක්වන ආකාරයට සඟරාව යනු සතිපතා හෝ මාසිකව ප්‍රකාශයට පත් වන ලිපි ලේඛන හෝ ඡායාරූප ඇතුළත් තනි ලේඛනයකි.

- යුනෙස්කෝ සංවිධානය

යුනෙස්කෝ සංවිධානයට අනුව සඟරාව යනු එදිනෙදා ජිවිතයට අවශ්‍ය තොරතුරු සහිත යම් නිශ්චිත කාලවකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන එකට බඳින ලද ප්‍රකාශනයකි.

සඟරාවක් යනු : යම් ක්ෂේත්‍රයක් අරමුණු කරගෙන හෝ යම් පාඨක පිරිසක් ඉලක්ක කරගෙන නිශ්චිත කාලසිමාවකදී පළවන කෙටි ලිපි හා රූප සටහන් සහිත ප්‍රකාශයකි. වාර ප්‍රකාශන ලෙසද මෙය හැඳින්වෙයි. මෙම සඟරා මාසිකව ද්වි මාසිකව මෙන්ම අර්ධ වාර්ෂිකව ලෙසද පළ විය හැකිය. විවිධ තේමා සහිත ලිපි මේවාට අයත් වෙයි. ඒ අතර කලාව, ආගම, ක්‍රීඩා, ආර්ථිකයව ආදියද ඇතුළත් වේ.

මුද්‍රිත ඉතිහාසය තුළ පොතට පසුව බිහිවන්නේ සඟරාවයි. ක්‍රි. ව. 1600 මෙය ආරම්භ වී ඇති බවට මත පලවෙයි.
ශ්‍රී ලංකාවෙන් පුවත්පතට තර සඟරාව ආරම්භ වි ඇත. ඒ 1822 වසරේදී **"මාසික තෑග්ග"** නම් සඟරාවයි.